**විදේශ රටවල දී මියගිය සංක්‍රමණික සේවකයන්ගේ පවුල්වලට වන්දි මුදල්/ ලැබිය යුතු වැටුප් සහ වෙනත් සහන ලබාදීම**

2015 නොවැම්බර් 26 දින විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද උත්සවයක දී මැද පෙරදිග හා රුසියාවේ සේවය කරමින් සිටිය දී මියගිය සංක්‍රමණික සේවකයන්ගේ පවුල්වලට වන්දි මුදල් ලබාදෙන ලදී. මෙහිදී වැඩබලන විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා විසින් මෙවැනි පවුල් 34 ක් අතරේ ශ්‍රී ලංකා රුපියල් මිලියන 50 ක මුදලක් බෙදා දෙන ලදී. මෙය 2015 වර්ෂයේ දී සංවිධානය කරන ලද මේ ආකාරයේ තුන්වැනි උත්සවයයි.

මෙම ගෙවීම් ලබාගන්නා ලද්දේ සවුදි අරාබිය, කටාර්, කුවේට්, ඊශ්‍රායලය, ඕමාන්, ඩුබායි, ජෝර්දානය, බහරේන් සහ රුසියාව යන රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සහායයෙනි. 2014 වසරේ දී ලැබිය යුතු වැටුප් සහ වෙනත් සහන ලෙස පවුල් 180 ක් අතරේ ශ්‍රී ලංකා රුපියල් මිලියන 195 ක් පමණ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් බෙදා දෙන ලදී. මෙම වර්ෂයේ දී වන්දි මුදල්/ප්‍රතිලාභ ලෙස මෙම අමාත්‍යාංශය පවුල් 116 ක් අතරේ රුපියල් මිලියන 169 ක් ලබාදුණි.

මෙම අරමුදල්වලින් කොටසක් ලබාගන්නා ලද්දේ විදේශ රටවල අදාළ අධිකරණයන් හි නඩුකර ගොනු කිරීමෙන් අනතුරුවය. වධහිංසා පැමිණිවීම් සහ තුවාල සිදුකිරීම් සිදු වූ අවස්ථාවල දී, මෙම දූත මණ්ඩල විසින් සේවා යෝජකයාගෙන් සෘජුවම මෙම ගෙවීම් ලබාගෙන තිබේ. වන්දි ලැබූවන් ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශ නියෝජනය කරන අතර ඉන් වැඩි පිරිස ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන්නන්ය. නිත්‍යානුකූල අන්දමින්, විශේෂයෙන් නුපුහුණු ප්‍රවර්ගය යටතේ රැකියාවෙහි නියැලී සිටින සංක්‍රමණික සේවකයන් සඳහා වන්දි මුදල්/ප්‍රතිලාභ ලබාගැනීමට විදේශ කටයුතු අමාත්‍යාංශය සහ විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් අදාළ රටවල අදාළ බලධාරීන් සමග සාකච්ඡා පැවැත්විය.

විදේශ රටවල සේවය කරන සංක්‍රමණික ශ්‍රී ලාංකික සේවකයන්ට අදාළ වන්දි මුදල්/ප්‍රතිලාභ ලබාගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබෙන බව ගරු වැඩබලන විදේශ කටයුතු අමාත්‍යවරයා රැස්ව සිටි පිරිස අමතමින් ප්‍රකාශ කළේය. රටේ ආර්ථිකයට මෙම සංක්‍රමණික සේවකයන්ගෙන් ලැබෙන දායකත්වයේ වැදගත්කම පිළිබඳ එතුමා මෙහිදී අවධාරණය කළේය. සමහර රටවල දී අත්විඳීමට සිදුවී ඇති දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, ගෘහ සේවිකාවන් ලෙස විදේශ රටවලට යන ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ සංඛ්‍යාව අඩු කිරීම නව රජයේ අරමුණ බව ගරු වැඩබලන විදේශ කටයුතු අමාත්‍යවරයා තවදුරටත් ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකාවේ සේවය කරමින් ශ්‍රී ලාංකික කාන්තාවන්ට රටේ ආර්ථිකය සඳහා දායක විය හැකි කදිම ඉඩප්‍රස්ථා ඇති නව ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීම රජයේ ප්‍රතිපත්තිය බව එතුමා පැවසීය.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ

2015 නොවැම්බර් 26